
# 17 ඒක දේව වන්දනාව

> "ඔබ ගොස්, සකල ජාතීන් ගෝලයන් කරන්න; පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙන් ඔවුන් බව්තීස්ම-ස්නාපනය කරන්න."
>
> (මතෙව් 28:19)

ඉහත සඳහන් ශුද්ධ ලියවිලි පාඨය කියවා පහත සඳහන් පින්තූර නම් කරන්න.



දිනක් ශුද්ධ වූ අගස්තීනු මුනිතුමා වෙරළක ඇවිදිමින් ශුද්ධ ත්‍රිත්වය පිළිබඳ අභිරහස වටහා ගැනීමට උත්සාහ කරමින් සිටියේ ය. එම අවස්ථාවේ දී වෙරළෙහි සිටි කුඩා දරුවෙකු ඔබ මොබ දුවමින් මුහුදේ ඇති ජලය සිප්පි කටුවකින් රැගෙනවිත් මුහුදු වෙරළේ ඇති කුඩා වළකට වත්කරන ආකාරය අගුස්තීනු මුනිතුමා දුටුවේ ය. එකෙණෙහි ම එතුමා, කුඩා දරුවා අමතා, ''දරුවා ඔබ කරන්නේ කුමක් ද''යි ඇසී ය. කුඩා දරුවා උත්තර දෙමින්



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

''මම මේ මහ මුහුදේ ජලය සියල්ල මෙම වළට පුරවන්න උත්සාහ කරන්නෙමි''යි පිළිතුරු දුන්නේ ය. අගුස්තීනු මුනිතුමා උත්තර දෙමින් ''මෙය ඔබට කළ හැකි කාර්යයක් ද? මෙම මහා සාගරයේ වතුර මේ කුඩා වළකට දැමිය හැකි ද? එය ඔබට කිසි කලෙක කළ නොහැකි ය''යි පවසමින් සිනාසුණේ ය. දරුවා උත්තර දෙමින් ''ඔබ සිතන දේත් එබන්දකි. ඔබට මෙම අභිරහස වටහා ගැනීම අපහසුයැ''යි පවසා නොපෙනී ගියේ ය. ත්‍රිත්වික දෙවියන් වහන්සේගේ මහිමාන්විත බව හා උත්කෘෂ්ට බව කරණ කොට ගෙන ඔවුන් වහන්සේ වටහා ගැනීම මිනිස් මනසට කළ නොහැකි දෙයකි.

## ශුද්ධ ලියවිල්ලෙන් ත්‍රිත්වික දෙවියන් වහන්සේට වන්දනාව

එවිට යක්ෂයා උන්වහන්සේ උස් තැනකට පමුණුවා, ක්ෂණයකින් ලෝකයේ සියලු රට රාජ්‍යයන් උන්වහන්සේට පෙන්වා, "මේවා කෙරෙහි මුළු ආධිපත්‍යය ද ඒවායේ යස ඉසුරු ද ඔබට දෙන්නෙමි. ඒවා මට පවරා දී ඇති හෙයින්, මා කැමැති කෙනෙකුට ඒවා දෙමි. එබැවින් ඔබ මා ඉදිරියේ නමස්කාර කරන්නෙහි නම් ඒ සියල්ල ම ඔබ සන්තක වන්නේ ය"යි උන්වහන්සේට කී ය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "නුඹේ දෙවි වන සමිඳාණන් වහන්සේට නමස්කාර කරන්න; උන්වහන්සේට පමණක් සේවය කරන්න' කියා ලියා ඇතැ"යි ඔහුට වදාළ සේක.

(ලූක් 4:5-8)

මෙම ශුද්ධ ලියවිලි පාඨයෙන් ක්‍රිස්තුන් වහන්සේ අපට පෙන්වා දෙන්නේ දේව වචනය හොඳින් අවබෝධ කර ගෙන දෙවියන් වහන්සේට පමණක් වන්දනා කළ යුතු බව යි. එමෙන් ම, බලය හෝ යස ඉසුරුවලට වහල් නොවී එක ම ඇදහිල්ලකින්, එක ම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කළ යුතු බව ක්‍රිස්තුන් වහන්සේ තරයේ පෙන්වා දෙන සේක.

මා හැර අන් කිසි ම දෙවි කෙනෙකු නුඹට නොසිටිය යුතු ය. නුඹ සඳහා නෙළූ රූපයක් හෝ ඉහළ අහසෙහිවත්, පහළ පොළොවෙහිවත්, පොළොවෙන් යට ජලයෙහිවත් ඇති කිසි ම වස්තුවකට සමාන දෙයක් හෝ සාදා නොගන්න. නුඹ ඒවාට නමස්කාර නොකරන්න. ඒවාට නොවඳින්න.

(නික්මයාම 20:3-5)

ශුද්ධ ත්‍රිත්වයෙහි මෙහි වහන්සේලා තිදෙනෙක් සිටියත් වැඩ සිටින්නේ එක ම දෙවි කෙනෙකි. උන්වහන්සේ ත්‍රිත්වික දෙවියන් වහන්සේ ය. මෙය කතෝලික විශ්වාසය යි. ශුද්ධ ත්‍රිත්වය අභිරහසකි. එය වටහා ගත හැක්කේ විශ්වාසයෙන් පමණි.

අපි සැවොම ත්‍රිත්වික දෙවියන් වහන්සේට පමණක් වන්දනා නමස්කාර කළ යුතු ය. පුරාණ ගිවිසුමේ නික්මයාම ග්‍රන්ථයේ සඳහන් වන දස පනතෙහි පළමු වන පනතින් දක්වනුයේ ද ඒක දේව වන්දනාව පිළිබඳ ව ය. කිතුනුවන්ගේ ජීවිතයේ කේන්ද්‍රීය අභිරහස වනුයේ ශුද්ධ ත්‍රිත්වය ය. දේව පුත්‍රයා මාංශගතවීමෙන් මනුෂ්‍යයාට දෙවියන් වහන්සේගේ ප්‍රේමය පෙන්නුම් කරයි. තව ද පියාණන් වහන්සේ, පුත්‍රයාණන් වහන්සේ හා ශුද්ධාත්මයාණන් වහන්සේ එක ම දෙවියන් වහන්සේ ය. ක්‍රිස්තුන් වහන්සේගෙන් පසු පියාණන් වහන්සේ විසින් ශුද්ධාත්මයාණන් වහන්සේ එවන ලදි. එබැවින් ශුද්ධාත්මයාණන් වහන්සේ පියාණන් හා පුත්‍රයාණන් වහන්සේ සමග වන්දනාවත් මහිමයත් ලබන සේක.

## ත්‍රිත්වික දෙවියන් වහන්සේගේ කාර්යයන්

පිතා, පුත්‍රයා හා ශුද්ධාත්මයාණන් යන වහන්සේලාට විවිධ කාර්යයන් පැවරී ඇත.

## පියාණන් වහන්සේගේ කාර්යභාරය

පියාණන් වහන්සේට විශ්වය මවා පරිපාලනය කිරීමේ කාර්ය පැවරී ඇත. උත්පත්ති පොතේ මැවීමේ කතාවෙන් එය පැහැදිලි කෙරේ.

> දෙවියන් වහන්සේ තමන් මවා වදාළ සියලු දේ නරඹා, එය ඉතා මනහර බව දුටු සේක.
> (උත්පත්ති 1:31)

විශ්වයේ පාලකයාණෝ ද උන්වහන්සේ ය.

## පුත්‍රයාණන් වහන්සේගේ කාර්යභාරය

පුත්‍රයාණන් වහන්සේට විශ්වය ගලවා ගැනීමේ කාර්යය හිමි ය. මිනිසාගේ ප්‍රථම අකීකරුකමේ පාපය හේතු කොට ගෙන ගැලවීමේ කාර්ය සඳහා ජේසුස් වහන්සේ දේව අභිමතය පරිදි මෙලොවට වැඩිය සේක. තම දුක් විඳීම හා මරණය තුළින් මිනිසා පාපයෙන් ගලවා ගත් සේක. ඒ තුළින් මිදීමත් පව් කමාවත් අපට ලැබී ඇත.

## ශුද්ධාත්මයාණන් වහන්සේගේ කාර්යභාරය

ශුද්ධාත්මයාණන් වහන්සේට විශ්වය ශුද්ධවත් කිරීමේ කාර්යය හිමි විය. ප්‍රසාද ස්නාපනය ලැබූ සියල්ලන් තුළ ම ශුද්ධාත්මයාණන් වහන්සේ ක්‍රියාත්මක වෙමින් ශුද්ධවත් කරන සේක. ශුද්ධාත්මයාණන් වහන්සේ අපගේ හදවත්වල වැඩ වාසය කරන සේක. එම නිසා ප්‍රසාද ස්නාපනය ලැබූවත් ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩ වාසය කරන දේව මාලිගා වේ.

## ත්‍රිත්වික දෙවියන් වහන්සේ හා ප්‍රසාද ස්නාපනය

අප ප්‍රසාද ස්නාපනය ලැබුවේ ද ශුද්ධ ත්‍රිත්වයේ නාමයෙනි. ".............(නම) පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද ශුද්ධාත්මයාණන්ගේ ද නාමයෙන් මම ඔබ බෞතීස්ම කරමි" කියමින් ඔබ ප්‍රසාද ස්නාපනය කරනු ලැබිණි. එමෙන් ම ප්‍රසාද ස්නාපන පොරොන්දුවෙන් ද ත්‍රිත්වික දෙවියන් වහන්සේ විශ්වාස කරන බව ඔබ වෙනුවෙන් දෙමවුපියොත් ඥාන මවුපියොත් පොරොන්දු වූහ.

පූජාප්‍රසාදීතුමා : අහසත් පොළොවත් මවා වදාළ සියලු බලැති දෙවි පියාණන් වහන්සේ කෙරෙහි ඔබ විශ්වාස කරන්නහු ද?

සියල්ලෝ : අපි විශ්වාස කරමු.

පූජාප්‍රසාදීතුමා : කන්‍යා මරියෝත්මාවන්ගෙන් ඉපිද, කුරුසියෙහි මරණයෙන් හා මහිමාන්විත උත්ථානය මගින් අප ගළවා ගත්, දෙවියන් වහන්සේගේ එක ම පුත්‍ර වූ අපගේ ස්වාමීන් වූ ජේසුස් වහන්සේ කෙරෙහි ඔබ විශ්වාස කරන්නහු ද?

සියල්ලෝ : අපි විශ්වාස කරමු.

පූජාප්‍රසාදීතුමා : ශුද්ධාත්මයාණන් වහන්සේ කෙරෙහි ද ශුද්ධ වූ සභාව කෙරෙහි ද සාන්තුවරයන්ගේ සමෝසධර්මලාභය කෙරෙහි ද ඔබ විශ්වාස කරන්නහු ද?

සියල්ලෝ : අපි විශ්වාස කරමු.

මෙම පොරොන්දුවලින් පෙන්වනු ලබන්නේ ත්‍රිත්වික දෙවියන් වහන්සේ විශ්වාස කරන බව ය.

## ත්‍රිත්වික දෙවියන් වහන්සේ හා පවුල

> පවුලේ සාමාජිකයන් අතර ඇති එකමුතුකම ශුද්ධ ත්‍රිත්වයේ එකමුතුකම පෙන්නුම් කරයි. දරුවන් බිහි කිරීම හා ඇති දැඩි කිරීම මගින් දෙවියන් වහන්සේගේ මැවීමේ කාර්යය දෙමව්පියන් ක්‍රියාවට නගයි. දිව්‍ය පූජාවට සහභාගි වීම, දිනපතා යාච්ඤාව හා දේව වචනය කියවීම පවුල තුළ ඇති ප්‍රේමය ශක්තිමත් කරයි. ධර්මදනය හා ධර්මදූත සේවය පවුලට පැවරෙන වගකීම් වේ.
>
> (ක.ස.ධ.2205)

## මිහිපිට වෙසෙන පවුලවල සේවාවන්

ත්‍රිත්වික දෙවියන් වහන්සේගේ සේවාව මෙන්, පවුලේ ද එකිනෙකාට අනන්‍ය වූ සේවා රාශිය ක් ඇත. කිතුනු පවුල එක්සත් ව එක්සිත් ව සිටිය යුතු ය. එමෙන් ම ක්‍රිස්තුන් වහන්සේ මෙන් අන්‍යයන්ට ප්‍රේම කරමින් ජීවත් විය යුතු ය. ශුද්ධ ත්‍රිත්වයේ සිටින තැනැත් වහන්සේලා තිදෙනා මෙන් නොබිඳෙන සාංඝික ජීවිතයක් ගත කළ යුතු ය. වහන්සේලා තිදෙනෙක් සිටියත් එක ම දෙවියන් වහන්සේ මෙන් පවුලේ ද සියලු දෙනාගේ ක්‍රියාකාරිත්වයන් එකිනෙකා හා සහයෝගයෙන් සමාදානයෙන් ඉටු කළ යුතු ය. මිහිපිට ශුද්ධ ත්‍රිත්වයේ සංකේතය කිතුනු පවුල විය යුතු ය.

**ක්‍රියාකාරකම**

1. පියාණන් වහන්සේගේ පුත්‍රයාණන් වහන්සේගේ හා ශුද්ධාත්මයාණන් වහන්සේගේ කාර්යයන් වෙන වෙන ම ලියන්න.
2. ශුද්ධ ත්‍රිත්වය පිළිබඳ අභිරහස කෙටියෙන් පහදන්න.
3. පවුල තුළ ත්‍රිත්වික දෙවියන් වහන්සේගේ ආදරය පෙන්විය හැකි ආකාරය දක්වෙන කතාවක් කෙටියෙන් ලියන්න.

**ජීවිතයට බිඳක්**

***එක ම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කරමු.***